කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2023

2025 - මැයි

**BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04)

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යටතේ "දේපල පිරියත හා උපකරණ" යන යෙදුම සුදුසු උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 යටතේ "තොග" යන යෙදුම සුදුසු උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 යටතේ අනාවරණය කිරීම් පහක් නම් කරන්න.

(ලකුණු 05)

ඈ. කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් 05 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක - 02**

අ. දේශීය ශාඛාවක් සහ විදේශීය ශාඛාවක් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පහත ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් පොත් වල සහ ශාඛාවේ ගිණුම් පොත් වල <u>වෙන වෙනම</u> සටහන් කරන්න.

i. ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට යවන ලද භාණ්ඩ තොගය - රු.534,000.

ii. ඉහත භාණ්ඩ තොගයෙන් රු.21,000 ක් වටිනා භාණ්ඩ නැවත ප්‍රධාන කාර්යාලය වෙත හරවා යවන ලදී.

iii. ශාඛාව විසින් දරන ලද ශාඛා වියදම් - රු.33,000.

iv. ප්‍රධාන කාර්යාලය විසින් දරන ලද ශාඛාවේ ගොඩනැගිලි කුලී වියදම රු.51,000.

v. ශාඛාව විසින් රු.86,000 ක් වටිනා භාණ්ඩ තොගයක්, තුන්වන පාර්ශවයකින්, ණය පදනම මත මිලදී ගන්නා ලදී.

vi. ශාඛා විකුණුම් වටිනාකම (ණය පදනම මත) - රු.950,000.

vii. ශාඛාවට අදාල ණයගැතියන්, ප්‍රධාන කාර්යාලය වෙත කල සෘජු ගෙවීම් රු.45,000 කි.

viii. ප්‍රධාන කාර්යාලය විසින්, රු.19,000 ක් වටිනා ශාඛා ගැනුම් දරන ලදී.

ix. ශාඛාව විසින් මිලදී ගත් ගෘහ භාණ්ඩ සමූහයේ වටිනාකම රු.354,000 කි.

x. ශාඛාව විසින්, රු.300,000 ක් වටිනා පරිගනකයක් ඔවුන්ගේ භාවිතය සඳහා මිලදී ගන්නා ලදී. නමුත්, එම පරිගනකයට අදාල ගිණුම ප්‍රධාන කාර්යාලයේ පොත්වල පවත්වාගෙන යන ලදී .

(ලකුණු 20)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක - 03**

අ. පහත දැක්වෙන යෙදුම් කෙටියෙන් පැහැදිලිකරන්න.

i. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01)

ii. ඇල්මැති පාර්ශවයන්

iii. තනි පුද්ගල ව්‍යාපාර

iv. වත්කම් සහ වගකීම්

v. ද්විත්ව සටහන් ක්‍රමය (ලකුණු 02x5 = 10)

ආ. 2025 වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රර්ථනා සහ සඳමිණී හවුල්ව්‍යාපාරයේ මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| ප්‍රාග්ධනය/ වගකීම් | වටිනාකම (රු.) | වත්කම් | වටිනාකම (රු.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ | | ගොඩනැගිලි | 1,130,000 |
| ප්‍රර්ථනා | 678,000 | කීර්තිනාමය | 435,000 |
| සඳමිණී | 549,000 | ආයෝජන | 214,000 |
| ආයෝජන උච්චාවචන අරමුදල | 490,000 | ණයගැතියෝ – අඩමාණ ණය වෙන්කිරීම (224,000 - 34,000) | 190,000 |
| ප්‍රර්ථනාගේ ණය | 74,000 | භාණ්ඩ තොග | 209,000 |
| සඳමිණීගේ ණය | 51,000 | බැංකු මුදල් | 202,000 |
| ණයහිමියෝ | 538,000 | | |
| එකතුව | 2,380,000 | එකතුව | 2,380,000 |

2025 වර්ෂයේ මාර්තු 31 වන දින හවුල්කරුවන් විසින් හවුල්ව්‍යාපාරය විසිරුවාහැරීමට තීරණය කරන ලද අතර එදින එකඟ වූ කොන්දේසි පහත පරිදි විය.

i. හවුල්ව්‍යාපාරය විසින් රු.54,000 ක් වටිනා භාණ්ඩ තොගයක් පවරා, ප්‍රර්ථනාගේගේ ණය මුදල පියවන ලදී.

ii. සඳමිණී විසින් හවුල්ව්‍යාපාරයේ ආයෝජන වලින් 2/5 ක්, එහි වටිනාකමෙන් 10%ක් අඩුවෙන් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියෝ රු.200,000 කට උපලබ්ධි විය.

iv. රු.28,000ක් අඩුවෙන් ණයහිමියෝ පියවන ලදී.

v. ගොඩනැගිලි රු.1,200,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු.400,000 කට නැවත තක්සේරු කර ඇත.

vii. හවුල්ව්‍යාපාරයේ ඉතිරි ආයෝජන රු.120,000 කට උපලබ්ධි වන ලදී.

viii. හවුල්ව්‍යාපාරයේ පොත්වල වාර්තා නොවූ යතුරුපැදියක්, ප්‍රර්ථනා විසින් රු.175,000 කට පවරාගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු.49,000 කි.

පහත ගිණුම් පිළියෙල කරන්න.

a) උපලබ්ධි ගිණුම. (ලකුණු 05)

b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 05)

c) බැංකු ගිණුම. (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක - 04**

අ. හවුල් ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ වාසි 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ. මොරීන් - නූරි හවුල් ව්‍යාපාරය සහ ඔටාරා - ප්‍රේම් හවුල් ව්‍යාපාරය යන හවුල් ව්‍යාපාර යුගලය, 2025 වර්ෂයේ අප්‍රේල් 01 වන දින 'සිතාරා වෙළඳ සමාගම' යන නමින් ඒකාබද්ධ කිරීමට එකඟ විය. එම දිනට, පැවති හවුල්ව්‍යාපාර දෙකෙහි ශේෂ පත්‍ර පහත පරිදි විය.

| ප්‍රාග්ධනය/ වගකීම් | මොරීන් සහ නූරි හවුල් ව්‍යාපාරය | ඔටාරා සහ ප්‍රේම් හවුල් ව්‍යාපාරය | වත්කම් | මොරීන් සහ නූරි හවුල් ව්‍යාපාරය | ඔටාරා සහ ප්‍රේම් හවුල් ව්‍යාපාරය |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | ගොඩනැගිලි | 246,000 | - |
| මොරීන් | 145,000 | - | කීර්තිනාමය | - | 168,000 |
| නූරි | 125,000 | - | ආයෝජන | 125,000 | - |
| ඔටාරා | - | 118,000 | ණයගැතියෝ | 106,000 | 175,000 |
| ප්‍රේම් | - | 116,000 | භාණ්ඩ තොග | 13,000 | 12,000 |
| පොදු සංචිත | 115,000 | - | | | |
| ණයහිමියෝ | 105,000 | 71,000 | | | |
| බැංකු ණය | - | 50,000 | | | |
| එකතුව | 490,000 | 355,000 | එකතුව | 490,000 | 355,000 |

මොරීන් සහ නූරි සමානව ලාභ/අලාභ බෙදාගත් අතර, ඔටාරා සහ ප්‍රේම් 2:3 අනුපාතයට ලාභ/අලාභ බෙදාගන්නා ලදී.

ඒකාබද්ධකිරීමේ කොන්දේසි පහත පරිදි විය:

I. නව සමාගම වන සිතාරා වෙළඳ සමාගම විසින්, මොරීන් සහ නූරි හවුල් ව්‍යාපාරයට අයිති ගොඩනැගිල්ල රු.170,000 කට පවරාගන්නා ලදී.

II. මොරීන් සහ නූරි හවුල් ව්‍යාපාරයේ ආයෝජන, සිතාරා වෙළඳ සමාගම විසින් පවරා නොගන්නා ලදී.

III. ඔටාරා සහ ප්‍රේම් හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය වටිනාකමක් නැතැයි එකඟ වූ අතර එය ලියා හරින ලදී.

IV. ඉහත ගැලපීම් වලින් පසු, රු.140,000 බැගින් අමතර ප්‍රාග්ධනය නව ව්‍යාපාරයට යෙදවීමට ඔටාරා සහ ප්‍රේම් එකඟ විය.

අවශ්‍ය වන්නේ;

a) මොරීන් සහ නූරි හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2025 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 07)

b) ඔටාරා සහ ප්‍රේම් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2025 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම. (ලකුණු 07)

c) 2025 අප්‍රේල් 01 දිනට සිතාරා වෙළඳ සමාගමෙහි ශේෂ පත්‍රය පිළියෙළ කිරීම. (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**